**එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාමේ සාරාංශය**

01. ක්‍රිස්තියානි ධර්මය I ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02 කි)

බහුවරණ ප්‍රශ්න 50 කි.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් (2 x 50) ලකුණු 100 කි.

02. ක්‍රිස්තියානි ධර්මය II ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03 කි)

මෙය I කොටස සහ II කොටස වශයෙන් කොටස් දෙකකි.

**I කොටසට ප්‍රශ්න 03 කි**

- ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට අනු කොටස් 05 කි.
- එක් අනු කොටසකට ලකුණු 04 බැගින් අනු කොටස් 05 ට ලකුණු 20 කි.
- ප්‍රශ්න 02 ටම (2 x 20) ලකුණු 40 කි.

**II කොටසට ප්‍රශ්න 05 කි**

- ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට (i) සහ (ii) වශයෙන් කොටස් දෙකකි.
- (i) කොටසට ලකුණු 10 ක් ද,
- (ii) කොටසට ලකුණු 10 ක් ද, වශයෙන් එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.
- ප්‍රශ්න තුනටම (3 x 20) ලකුණු 60 කි.

03. I පත්‍රය ලකුණු - 100

II පත්‍රය ලකුණු - 100

200

මුළු ලකුණු - 200 ÷ 2 = 100

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

- ..........................................................
  ..........................................................
  .......................................................... √ △ $\frac{4}{5}$
- ..........................................................
  ..........................................................
  .......................................................... √ △ $\frac{3}{5}$
- ..........................................................
  ..........................................................
  .......................................................... √ △ $\frac{3}{5}$

- (03) + (ii) $\frac{4}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{3}{5}$ □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

ක්‍රිස්තියානි ධර්මය I
கிறிஸ்தவம் I
Christianity I

43 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ශුද්ධ බයිබලයේ පොත් ගණනාවක් ඇතත් එය එක පොතක් වන්නේ,
(1) එකට බැඳී ඇති නිසා ය. (2) එහි තේමාව එකක් වන නිසා ය.
(3) එකට ගොනු කර ඇති නිසා ය. (4) පැපිරස් පත්‍රිකාවල ලියැවී ඇති නිසා ය.
(5) උප කතෘ මිනිසා වන නිසා ය.

**2.** ශුද්ධ බයිබලය ලිවීමේ පරමාර්ථය සඳහන් ලිපිය කුමක් ද?
(1) 1 තිමෝති (2) හෙබ්‍රෙව් (3) 1 කොරින්ති (4) 2 කොරින්ති (5) 2 තිමෝති

**3.** පංච පුස්තකය,
(1) නීති පොත් ගණයට අයත් ය. (2) දිවැසිවර පොත් ගණයට අයත් ය.
(3) සන්දේශ පොත් ගණයට අයත් ය. (4) ලෙවි ව්‍යවස්ථා පොත් ගණයට අයත් ය.
(5) ද්විතීය නීති සංග්‍රහ පොත් ගණයට අයත් ය.

**4.** ශුද්ධ බයිබලය ලිවීම ආරම්භ වූයේ කුමන රජ සමයේ ද?
(1) සාවුල් (2) දාවිත් (3) සලමොන්
(4) රෙහෙබෝවාම් (5) ජෙරබෝවාම්

**5.** ඉශ්‍රායෙල් ජනතාව මිදියන්වරුන්ගෙන් බේරාගැනීමට දෙවියන් වහන්සේ ක්‍රියා කළේ කවුරුන් මඟින් ද?
(1) සාමුවෙල් (2) දෙබෝරා (3) එස්තර් (4) ගිඩියොන් (5) සැම්සන්

**6.** දෙවියන් වහන්සේ කානාන් දේශය බෙදා දෙන ලද්දේ
(1) මෝසෙස් මඟිනි. (2) ජෝෂුවා මඟිනි. (3) ජුදා මඟිනි.
(4) ජෝශප් මඟිනි. (5) ආබ්‍රහම් මඟිනි.

**7.** දාවිත් රජ සමයේ සිදු වූ වැදගත් සිදුවීමක් වන්නේ,
(1) බෙතෙල් හි පිහිටි වන්දනා ස්ථාන නවීකරණය කිරීම ය.
(2) දාන් හි වන්දනා ස්ථාන ආරම්භ කිරීම ය.
(3) පියාගෙන් පුතුට බලය පැවරෙන රාජ පරම්පරා ක්‍රමයක් ඇති කිරීම ය.
(4) උතුරු දකුණු රාජ්‍යය ලෙස කොටස්වලට බෙදා පාලනය කිරීම ය.
(5) ජුදා ජනතාව බැබිලෝනියට පිටුවහල් කිරීම ය.

**8.** උතුරු රාජ්‍යය තුළ ආරම්භ වූ සම්ප්‍රදාය දෙක වන්නේ,
(1) E සහ D ය. (2) E සහ P ය. (3) J සහ D ය. (4) J සහ E ය. (5) J සහ P ය.

**9.** දෙවියන් වහන්සේ මෝසෙස්ට පමණක් දේව බල මහිමය පෙන් වූ බව තේමාවක් කරගත් සම්ප්‍රදාය වන්නේ,
(1) D සම්ප්‍රදායයි. (2) E සම්ප්‍රදායයි. (3) J සම්ප්‍රදායයි. (4) P සම්ප්‍රදායයි. (5) වාචික සම්ප්‍රදායයි.

**10.** මිනිසා දුව්ල්ලෙන් මැවීම තුළ සංකේතවත් කරනුයේ,
(1) දේව ආදරයයි. (2) දේව රැකවරණයයි.
(3) අභිරහස්‍යමය ස්වරූපයයි. (4) මරණයට පත්වන බවයි.
(5) පහත් බවයි.

**11.** පාපය සම්බන්ධව ප්‍රධාන ඉගැන්වීම දක්නට ලැබෙන්නේ,
(1) නික්මයාම පොතේ ය. (2) ලෙවී ව්‍යවස්ථාවේ ය.
(3) ගණන් කතාවෙහි ය. (4) උත්පත්ති පොතේ ය.
(5) ද්විතීය නීති සංග්‍රහයේ ය.

**12.** මෝසෙස් හැදී වැඩුණේ කවරෙකුගේ සියලු සැප සම්පත් මැද ද?
(1) පාරාවෝගේ ය. (2) දාවිත්ගේ ය. (3) ආරොන්ගේ ය. (4) ආබ්‍රහම්ගේ ය. (5) ජෝශප්ගේ ය.

**13.** දෙවියන් වහන්සේ විසින් මෝසෙස් පාරාවෝගේ රජ මැදුරට යවනු ලැබ එහිදී මෝසෙස් අනතුරු අඟවමින් මතු සිදුවන්නට යන දේ පවසා සිදු කළ වසංගතයක් වන්නේ,
(1) කිණිතුලු උවදුරයි. (2) මැඩි උවදුරයි. (3) ගල් වර්ෂාවයි.
(4) ගඩු උවදුරයි. (5) මැසි උවදුරයි.

**14.** මිසරවාසීන් මුහුණ දුන් වසංගත කිහිපයක් පහත දැක්වේ.
A - කිණිතුලු උවදුර
B - පළගැටි උවදුර
C - සනඳුරු උවදුර
D- ගව සම්පත් වැනසීම
E- ගඩු උවදුර
F- කුළුඳුලන් මැරීම
මේවා අතුරෙන් පාරාවෝ සමග ගනුදෙනුවකින් තොරව මෝසෙස් හා ආරොන් එක්ව ඇති කළ උවදුරු සඳහන් පිළිතුර තෝරන්න.
(1) A, B සහ D ය. (2) A, C සහ F ය. (3) A, D සහ E ය. (4) A, E සහ F ය. (5) C, D සහ E ය.

**15.** පාස්කුව යනු,
(1) එඬේර මංගල්‍යයකි. (2) කෘෂිකාර්මික මංගල්‍යයකි. (3) ධීවර මංගල්‍යයකි.
(4) විවිධ වෘත්තියවල මංගල්‍යයකි. (5) මිසර වැසියන්ගේ මංගල්‍යයකි.

**16.** දෙවියන් වහන්සේ තමන් වහන්සේට විරුද්ධ වූ ජනතාව විනාශයට පත් කළ ද මානව සංහතියේ පැවැත්ම විනාශ නොකළ බව පෙන්වා දෙන කතා පුවත වන්නේ,
(1) බාබෙල් කොත පිළිබඳ කතා පුවතයි.
(2) ආදම් සහ ඒව පිළිබඳ කතා පුවතයි.
(3) ඊසාක් පූජාවක් ලෙස ඔප්පු කිරීමේ කතා පුවතයි.
(4) ජලගැල්ම පිළිබඳව කතා පුවතයි.
(5) සොදොම් ගොමෝරා කතා පුවතයි.

**17.** ගෝත්‍රික ජනතාවක් වූ ඉශ්‍රායෙල් ජනතාව සදාචාර සම්පන්න ජාතියක් බවට පත් වූයේ,
(1) භාග්‍ය අටට පක්ෂපාතී වීමෙනි. (2) සීනයි ගිවිසුමට පක්ෂපාතී වීමෙනි.
(3) බාල් දෙවිවරු ඇදහීමෙනි. (4) දේශපාලන බලපෑමෙනි.
(5) සමාජ බලපෑමෙනි.

**18.** පහත දී ඇත්තේ දිවැසිවරයන්ගේ නම් කීපයකි.
A - යෙසායා B - හොෂියා C - ජෝවෙල්
D - එසකියෙල් E - ජෙරමියා
ඉහත සඳහන් දිවැසිවරු අතුරෙන් ප්‍රධාන දිවැසිවරු සඳහා වන අක්ෂර මොනවා ද?
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, D සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**19.** එසකියෙල් දිවැසිවරයා තම දිවැසි කාර්යයේ නියැලුණු ප්‍රදේශය,
(1) පලස්තීනයයි. (2) අසිරියාවයි. (3) මිසරයයි.
(4) බැබිලෝනියාවයි. (5) සමාරියාවයි.

**20.** "සියොන් පුරගන... ඔබේ රජතුමාණෝ ඔබ වෙතට වඩින සේක." යන්නෙන් ශුද්ධ බයිබලයේ ප්‍රකාශ කරන්නේ,
(1) ජෝවෙල් දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.
(3) එසකියෙල් දිවැසිවරයා ය. (4) මීකා දිවැසිවරයා ය.
(5) සෙකරියා දිවැසිවරයා ය.

**21.** ප්‍රසිද්ධියේ නොපෙනුනත්, සමාජය තුළ සැඟවුණු අසාධාරණකම් පිළිබඳව කතා කළ දිවැසිවරයා වන්නේ,
(1) යෙසායා ය. (2) ජෙරමියා ය. (3) ආමෝස් ය.
(4) එසකියෙල් ය. (5) මීකා ය.

**22.** රෝම අධිරාජ්‍යයේ බලයෙන් වැඩි වාසි ප්‍රයෝජන ගනු සඳහා රෝම වන්දිභට්ටයින් සේ ජුදා සමාජය තුළ ක්‍රියා කළ පිරිස වූයේ,
(1) හෙරෝදිවරු වේ. (2) පරිසිවරු වේ. (3) එසේනිවරු වේ.
(4) සද්දූසිවරු වේ. (5) ලෙවිවරු වේ.

**23.** සමාජ තත්ත්වයෙන් පහත් අය ලෙස සලකනු ලැබූ පිරිසක් වූයේ,
(1) පරිසිවරු ය. (2) සද්දූසිවරු ය. (3) හෙරෝදිවරු ය.
(4) සමරිතානුවරු ය. (5) එසේනිවරු ය.

**24.** ක්‍රිස්තුන් වහන්සේගේ ළමා විය පිළිබඳව සඳහන් කරන සුවිශේෂ ද්විත්වය කවුරුන් ද?
(1) මාක්-මතෙව් වේ. (2) ලූක්-මතෙව් වේ. (3) ජොහන්-මාක් වේ.
(4) මතෙව්-ජොහන් වේ. (5) මාක්-ලූක් වේ.

**25.** දේව මාළිගයේ තිරය දෙකඩවීමෙන් සංකේතවත් කරනුයේ,
(1) ක්‍රිස්තුන් වහන්සේගේ සන්තාපය ප්‍රකාශ වන බවයි.
(2) දෙවියන් වහන්සේ වෙතට යන මාර්ගය ක්‍රිස්තුන් වහන්සේ විවෘත කර දීමයි.
(3) දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සැක සහිත බවයි.
(4) උත්ථානය සිදුවන බව කලින් දැනුම් දීමක් බවයි.
(5) පාරිසරික වෙනස්කම් මගින් උත්ථානයේ පණිවුඩය ප්‍රකාශ වන බවයි.

**26.** ස්තේපන්ට පසුව ග්‍රීක ජුදයින්ගේ නායකයා ලෙස කටයුතු කරනු ලැබුවේ,
(1) ජාකොබ් ය. (2) පාවුලු ය. (3) අනනියස් ය.
(4) පිලිප් ය. (5) බාර්ණබස් ය.

**27.** ග්‍රීක සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස හැඳින්විය හැකි, බොහෝ විද්වතුන් සහ දාර්ශනිකයන් බිහි කළ නගරයක් වනුයේ,
(1) තාර්සිස් ය. (2) එපීසය ය. (3) අන්තියෝකිය ය.
(4) ලුස්ත්‍රාව ය. (5) කොරින්තිය ය.

**28.** මරිය දහමට පන්නරයක් ලැබුණු මන්ත්‍රණ සභාව කුමක් ද?
(1) එපීස මන්ත්‍රණ සභාව ය.
(2) නිසියානු මන්ත්‍රණ සභාව ය.
(3) කැල්සිඩොන් මන්ත්‍රණ සභාව ය.
(4) කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාව ය.
(5) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව ය.

**29.** තර්කවේදීන් අතර දක්ෂතම තර්කවේදියා වන්නේ,
(1) ශුද්ධ වූ මහා ග්‍රෙගරිතුමා ය. (2) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා ය.
(3) ශුද්ධ වූ අගොස්තීනුතුමා ය. (4) ශුද්ධ වූ මහා බැසිල්තුමා ය.
(5) ශුද්ධ වූ ජස්ටින්තුමා ය.

**30.** ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒකාබද්ධව තිබූ මනුෂ්‍ය ස්වභාවය ප්‍රතික්ෂේප කිරීමකට ලක් කළ දුර්මත වාදය වූයේ,
(1) පිලාජියානු වාදයයි. (2) ඒරියන් වාදයයි.
(3) එව්ටිකියන් වාදයයි. (4) නෙස්ටෝරියන් වාදයයි.
(5) අප්‍රධානතා වාදයයි.

**31.** ශුද්ධෝත්තම VIII වන බොනිපස් පාප්තුමන් විසින් මහා සභා පියවරුන් ලෙස නම් කරන ලද්දේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ ජෙරොම්තුමා, ශුද්ධ වූ අගොස්තීනුතුමා, ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා සහ ශුද්ධ වූ ග්‍රෙගරිතුමා
(2) ශුද්ධ වූ ග්‍රෙගරිතුමා, ශුද්ධ වූ මහා බැසිල්තුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා සහ ශුද්ධ වූ අතනාසියස්තුමා
(3) ශුද්ධ වූ ජෝන් ක්‍රිසොස්තම්තුමා, ශුද්ධ වූ ග්‍රෙගරිතුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා සහ ශුද්ධ වූ අගොස්තීනුතුමා
(4) ශුද්ධ වූ පොලිකාප්තුමා, ශුද්ධ වූ ඉග්නාසියස්තුමා, ශුද්ධ වූ ග්‍රෙගරිතුමා සහ ශුද්ධ වූ ජෙරොම්තුමා
(5) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා, ශුද්ධ වූ ග්‍රෙගරිතුමා, ශුද්ධ වූ පොලිකාප්තුමා සහ ශුද්ධ වූ ජෙරොම්තුමා

**32.** ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ තවත් මැවිල්ලක් බව ප්‍රකාශ කළ වේද භේදය හඳුන්වනුයේ,
(1) එව්ටිකියන් ලෙස ය. (2) නෙස්ටෝරියන් ලෙස ය.
(3) ඒරියන් ලෙස ය. (4) මොනිපිටියන් ලෙස ය.
(5) පිලාජියානු ලෙස ය.

**33.** ක්‍රි.ව. 431 දී එපීස මන්ත්‍රණ සභාව පවත්වනු ලැබුවේ කුමන හේතුව නිසා ද?
(1) අප්‍රධානතාවාදයට පිළිතුරු දීම සඳහා ය.
(2) නෙස්ටෝරියානු වේද භේදයට පිළිතුරු දීම සඳහා ය.
(3) ඒව්ටිකියන් වේද භේදයට පිළිතුරු දීම සඳහා ය.
(4) ඒරියන් වේද භේදයට පිළිතුරු දීම සඳහා ය.
(5) මොනිපිටියානු වාදයට පිළිතුරු දීම සඳහා ය.

**34.** ඇලෙක්සැන්ඩ්‍රියා ගුරු කුලයේ ප්‍රධානියා වශයෙන් ඉතිහාසයේ නම් කර ඇති සභා පිතෘවරයා,
(1) ශුද්ධ වූ සිරිල්තුමා වේ. (2) ශුද්ධ වූ ජෙරම්තුමා වේ.
(3) ශුද්ධ වූ ඔරිගන්තුමා වේ. (4) ශුද්ධ වූ ජස්ටින්තුමා වේ.
(5) ශුද්ධ වූ ටර්ටූලියන්තුමා වේ.

**35.** දිව්‍ය පූජාවේ උච්චාරණය කරනු ලබන විශ්වාස ලක්ෂණය සභාවේ වේද සත්‍යතාවක් බවට පිළිගෙන භාවිත කිරීමට නියෝග කළේ කුමන මන්ත්‍රණ සභාව ද?
(1) ජෙරුසලම් මන්ත්‍රණ සභාව ය.
(2) නිසියානු මන්ත්‍රණ සභාව ය.
(3) කැල්සිඩොන් මන්ත්‍රණ සභාව ය.
(4) එපීස මන්ත්‍රණ සභාව ය.
(5) කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාව ය.

**36.** ඇටිල්ලා නමැති 'හන්' ගෝත්‍රික නායකයාගේ පහරදීම්වලින් රෝමය ආරක්ෂා කරගැනීමට පුරෝගාමී වූයේ,
(1) මහා ග්‍රෙගරි පාප්තුමා ය. (2) XII වන ජෝන් පාප්තුමා ය.
(3) I වන ලියෝ පාප්තුමා ය. (4) ශුද්ධ වූ බොනිපස්තුමා ය.
(5) II වන සිල්වෙස්ටර් පාප්තුමා ය.

**37.** 'කිතුනු ආගමේ සංහිතා' නමැති ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලද්දේ,
(1) මාටින් ලූතර්තුමා විසිනි. (2) ජෝන් වෙස්ලිතුමා විසිනි.
(3) විලියම් බූත්තුමා විසිනි. (4) උල්රිච් ස්වින්ග්ලිතුමා විසිනි.
(5) ජෝන් කැල්වින්තුමා විසිනි.

**38.** ක්‍රි.ව. 1054 දී පෙරදිග සභාව කතෝලික සභාවෙන් වෙන් වී ග්‍රීක් ඕර්තඩොක්ස් සභාව බිහිවීමට හේතු වූයේ,
(1) දේව ප්‍රසාද නිධාන ප්‍රතික්ෂේප කිරීමයි.
(2) ශුද්ධ වූ බයිබලය ප්‍රතික්ෂේප කිරීමයි.
(3) දිව්‍ය පූජාව ප්‍රතික්ෂේප කිරීමයි.
(4) එකම සභාවක් යන දේව අභිමතයට පිටුපෑමයි.
(5) පූර්ණ එල වලට පිටුපෑමයි.

39. "දේව ධර්මය යනු අවබෝධය සොයා යන ඇදහිල්ලකි." මෙලෙස හඳුන්වා දෙනු ලැබුවේ,
(1) ජෝන් කැල්වින් විසිනි. (2) පීටර් ලොම්බාර්ඩ්තුමා විසිනි.
(3) ශුද්ධ වූ අගෝස්තීනුතුමා විසිනි. (4) මාටින් ලූතර් විසිනි.
(5) කැන්ටබරි හි ශුද්ධ වූ ඇන්සලම්තුමා විසිනි.

40. කාර්මෙල් නිකායේ තාපස ජීවිතය එංගලන්තයට හඳුන්වා දෙන ලද්දේ,
(1) ශුද්ධ වූ සයිමන් ස්ටොක් ය. (2) අවිලාහි තෙරේසාතුමිය ය.
(3) කුරුසියේ ජොහන්තුමා ය. (4) අසීසියේ ප්‍රැන්සිස්තුමා ය.
(5) පීටර් කැනීසියස්තුමා ය.

41. කාන්තාවන් අපෝස්තලික සේවයේ නියැලීම සඳහා අරඹනු ලැබූ ප්‍රථම නිකාය,
(1) ශුද්ධ වූ පවුලේ නිකාය වේ. (2) කාර්මෙල් නිකාය වේ.
(3) සුරදූත නිකාය වේ. (4) දයාවේ සොයුරියෝ වේ.
(5) යහපත් එඬේරාගේ නිකාය වේ.

42. මෙරට කිතුනු සභා ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් මූලාශ්‍රයක් වන "ද ක්‍රිස්ටියන් ටොපෝග්‍රෆි" ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(1) රොබට් නොක්ස් විසිනි. (2) කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් විසිනි.
(3) සෙනරත් පරණවිතාන විසිනි. (4) ගොන්සාල්වෙස් පියතුමා විසිනි.
(5) දොන් ජෙරනිමෝ විසිනි.

43. සීගිරි සමයේ ඉන්දියාවෙන් පැමිණි මිගාර සෙන්පතියා කිතුනුවෙකු වන අතර ඔහු විසින් තනන ලද දෙවි මැදුරේ "අභිෂේක ජින" ලෙස හඳුන්වා ඇත්තේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ යන මතය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) අබූසයිද් විසිනි. (2) සෙනරත් පරණවිතාන විසිනි.
(3) ඒ. ආර්. අයර්ටන් විසිනි. (4) බෙන්ජමින් රබායි විසිනි.
(5) ලෙනාඩ් වුල්ෆ් විසිනි.

44. ධර්මපාල රජු 1557 දී කතෝලික දහම වැළඳ ගත්තේ කිනම් නාමයෙන් ද?
(1) මායාදුන්නේ යන නමින් ය. (2) දොන් ජුවම් ධර්මපාල යන නමින් ය.
(3) ජුවන් ද විලා යන නමින් ය. (4) රයිගම් බණ්ඩාර යන නමින් ය.
(5) අන්තෝනියෝ යන නමින් ය.

45. පෘතුගීසි සමයේ කතෝලික ධර්මදූතවරුන්ගේ ධර්මදානීය කටයුතු පහසුවෙන් කරගත හැකි වූයේ ඔවුන් තුළ පැවති කුමන ලක්ෂණයක් නිසා ද?
(1) බුද්ධිමත් භාෂා ඥානය (2) සරල ජීවිත පැවැත්ම (3) වැඩ වසම් ක්‍රමය
(4) සමාජ ජීවිත පැවැත්ම (5) මූල්‍යමය පහසුකම් සැලසීම

46. ශුද්ධ බයිබලය සිංහල භාෂාවට පරිවර්තනය සහ ජනයා අතර ව්‍යාප්ත කිරීම ආරම්භ වූයේ කිනම් පාලන සමයේ ද?
(1) පෘතුගීසි (2) ලන්දේසි (3) ඉංග්‍රීසි (4) සිංහල (5) දෙමළ

47. ශුද්ධ බයිබලය ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කළේ,
(1) ඥානප්‍රකාශර් පියතුමා විසිනි. (2) ජේදුරු පුලිවර් විසිනි.
(3) සුවං කණවාල් පියතුමා විසිනි. (4) පර්සිවල් අයියර් විසිනි.
(5) හෙන්රි හෙන්රිකස් විසිනි.

48. පහත දැක්වෙන්නේ ලක් කිතුනු ඉතිහාසයේ වැදගත් ග්‍රන්ථ කිහිපයකි.
A - වේද කාව්‍යය
B - මංගල ගීතය
C - කොන්ස්තන්තීනු හටන
D - මහෝපදේශය
E - නල්ලූර් ස්වාමි
මේවා අතුරෙන් ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා විසින් රචිත ග්‍රන්ථ පමණක් ඇති වරණය තෝරන්න.
(1) A සහ B (2) A සහ E (3) B සහ C (4) B සහ D (5) C සහ D

**49.** මෙරට තුළ දියෝකිසි හෙවත් පදවි දෙකක් යටතේ සංවිධානය වී සේවාවේ නිරත වන ක්‍රිස්තියානි සභාව,

(1) ලංකා සභාව ය.
(2) මෙතෝදිස්ත සභාව ය.
(3) බැප්ටිස්ට් සභාව ය.
(4) රෙපරමාදු ක්‍රිස්තියානි සභාව ය.
(5) දකුණු ඉන්දියානු සභාව ය.

**50.** අතීතයේ සිදු වූ සියලු බෙදීම් සියල්ල අකාමකා එකම ක්‍රිස්තුන් වහන්සේගේ එකම සභාවක් වෙනුවෙන් ඇප කැපවීම හෙවත් ඒ වෙනුවෙන් දරණ ප්‍රයත්නය වනුයේ,

(1) කිතුනු සභා සංවාදය වේ.
(2) කිතුනු සභා එකමුතුව වේ.
(3) කිතුනු සභා හමුව වේ.
(4) කිතුනු සභා සහභාගිත්වය වේ.
(5) කිතුනු සභා සංවිධානය වේ.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019**

**පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்**

| විෂයය අංකය பாட இலக்கம் | 43 | විෂයය பாடம் | ක්‍රිස්තියානි ධර්මය |
|---|---|---|---|

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**
**I පත්‍රය/பத்திரம் I**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 3 | 31. | 1 | 41. | 4 |
| 02. | 5 | 12. | 1 | 22. | 1 | 32. | 3 | 42. | 2 |
| 03. | 1 | 13. | 2 | 23. | 4 | 33. | 2 | 43. | 2 |
| 04. | 3 | 14. | 2 | 24. | 2 | 34. | 3 | 44. | 2 |
| 05. | 4 | 15. | 1 | 25. | 2 | 35. | 5 | 45. | 2 |
| 06. | 2 | 16. | 4 | 26. | 4 | 36. | 3 | 46. | 2 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 5 | 47. | 4 |
| 08. | 1 | 18. | 3 | 28. | 1 | 38. | 4 | 48. | 1 |
| 09. | 4 | 19. | 4 | 29. | 5 | 39. | 5 | 49. | 1 |
| 10. | 3 | 20. | 5 | 30. | 3 | 40. | 1 | 50. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019 (පැරණි නිර්දේශය)

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය

01.

(i) ශුද්ධ බයිබලය ලේඛනගත කිරීමේ දී උප කතෘ ක්‍රියා කළ ආකාරය කරුණු **හතරකින්** දක්වන්න.

- සිහිබුද්ධිය ඇති මිනිසුන් වෙන් කර ගැනීම.
- උපකතෘගේ ගුණාත්මක බලය ද නික්මෙන ප්‍රතිඵලය ද සැලකිල්ලට ගැනීම.
- දෙවියන් වහන්සේ වන ප්‍රධාන කතෘ, මිනිසා වන උපකතෘ මෙහෙයවනු ලැබීම.
- දෙවියන් වහන්සේ උපකතෘ තුළින් ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම.
- දේව ආනුභාවයෙන් උපකතෘ සන්නිවේදනය කිරීමට යොමු වීම.

(ii) පුරාණ පෙරදිග ලෝකයේ 'සර්පයා' මගින් සංකේතවත් කළ කරුණු **හතරක්** දක්වන්න.

- සර්පයා මිනිසාගේ සතුරෙකු ලෙස සැලකීම.
- ගුප්ත ඥානයේ සංකේතය.
- සශ්‍රීකත්වයේ හා පිළිවෙත්වල සංකේතය (කානානිවරුන්ගේ).
- අෂෙරා දේවතාවිය නියෝජනය වීම

(iii) සමාරියට අයත් ප්‍රදේශ **හතරක්** නම් කරන්න.

- බෙතෙල්
- ශිලෝ
- ෂෙකෙම්
- කීර්සා
- සමාරියාව
- දෝකන්

(iv) ශුද්ධ වූ පාවුලුතුමා සඳහන් කරන පරිදි මැරෙන මොහොතේ ශරීරයේ ස්වභාවය සහ උත්ථාන වූ මොහොතේ ශරීරයේ ස්වභාවය අතර වෙනස කරුණු **හතරකින්** දක්වන්න.

| මැරෙන මොහොත | උත්ථානයේ මොහොත |
|---|---|
| • දිරන සුළුයි | • නොදිරන සුළුයි |
| • මැරෙන සුළුයි | • අමරණීයයි |
| • දුර්වලයි | • බලවත් ශරීරයක් |
| • මිනිස් ස්වභාවයක් | • අධ්‍යාත්මික ස්වභාවයක් |
| • පසෙන් මවනු ලැබූ ශරීරයක් | • ස්වර්ගයෙන් පැමිණෙන තැනැන්වහන්සේ |

(v) ස්තේපන්ට පසුව ග්‍රීක ජුදයින්ගේ නායකයා ලෙස කටයුතු කළ පිලිප්, සමාජයෙහි කළ මෙහෙවර කරුණු **හතරකින්** දක්වන්න.

- ශුභාරංචිය ප්‍රකාශ කිරීම.
- අශුද්ධාත්මයාණන් දුරු කිරීම.
- බෞතීස්ම ස්නාපනය ලබා දීම.
- සමාරියන්ව ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරවීම.

**(ලකුණු 4 × 5 =20)**

02.

(i) රතු මුහුද තරණය පිළිබඳව ඉදිරිපත් වී ඇති මතවාද **හතරක්** ලියා දක්වන්න.

- ලේඛකයා ඉදිරිපත් කරන විස්තරයට අනුව ඊශ්‍රායෙල් ජනතාව රතු මුහුද අසලටවත් නොගිය බව මාර්ග ගැන හැදෑරීමෙන් අවබෝධ කරගත හැක.
- මධ්‍යධරණී මුහුදට කිට්ටුව ඇති කලපුවක් වන සිරිබොනිස් විල දෙසට ගමන් කර ඇත.
- මිට්ෂා විල් ප්‍රදේශයේ වගුරුබිම් කඩකට ඔවුන් එන්නට ඇත.
- මෙම සිදුවීම් සම්ප්‍රදායන් දෙකකින් (P සහ J) ඉදිරිපත් කර ඇත.
- ඊශ්‍රායෙල් ජනතාව ලුහුබැඳ ආ බලගතු පාරාවෝ ගෙන් ගැලවීම.

(ii) සැබවින්ම දුක් විඳින සේවකයා යනු කව් ද? කරුණු **හතරකින්** පැහැදිලි කරන්න.

- විටෙක ඔහු පුද්ගලයෙක්
- විටක සමූහයක් නියෝජනය කරන්නෙක්
- දිවැසිවරයෙක්
- විමුක්තිදායකයෙක්
- දුක්විඳින සේවකයෙක් (දාසයෙක්)

(iii) ශුද්ධෝත්තම VII වන පියුස් පියතුමන්ගේ කාලයේ ආරම්භ වූ නව පැවිදි නිකාය **හතරක්** සඳහන් කරන්න.

- මේරියනිට්ස්
- ලොරෙට්ටෝ පැවිදි සොයුරියෝ
- දේව වචනයේ සභාව
- පොලිස්ටස් හා සැලේසියානු නිකාය
- සුදු පියවරු
- මාරිස්ට් නිකාය
- ලාසල් සහෝදරවරු
- දයාවේ සොහොයුරියෝ

(iv) පෘතුගීසි මිෂනාරි ප්‍රයත්නය මෙරට තුළ සාර්ථකවීමට බලපෑ හේතු **හතරක්** සඳහන් කරන්න.

- ධර්මදූතයන්ගේ දැඩි කැපවීම හා උද්යෝගය
- නොදන්නා දේශයක නොදන්නා සෙනගකට සේවය කිරීම
- ධර්මදූතවරුන්ට පෘතුගීසි පාලකයන්ගේ ලැබුණු අනුග්‍රහය
- ධර්මදූතයින්ගේ ධර්ම ප්‍රචාර ක්‍රම
- ධර්මදූතයන්ගේ සරල අල්පේච්ඡ ජීවිත රටාව, ආදර්ශය.

(v) අන්තිම රාත්‍රි භෝජනය හා සම්බන්ධව පවතින වාර්තා **හතරක්** නම් කරන්න.

- ශුද්ධ වූ මතෙව් සුවිශේෂකවරයාගේ වාර්තාව
- ශුද්ධ වූ මාක් සුවිශේෂකවරයාගේ වාර්තාව
- ශුද්ධ වූ ලූක් සුවිශේෂකවරයාගේ වාර්තාව
- ශුද්ධ වූ පාවුලුතුමාගේ වාර්තාව

**(ලකුණු 4 × 5 =20)**

03.
(i) දිවැසිවර ඉගැන්වීම්වලට අනුව සමාජය තුළ අසාධාරණත්වය සිදු කරන විවිධ ක්ෂේත්‍ර **හතරක්** දක්වන්න.

- ආර්ථිකය (ධනය, නිෂ්පාදන මාධ්‍ය)
- පාලන බලය
- අධිකරණ (නීතිය)
- සාමය (ආගමික ක්ෂේත්‍රය)

(ii) ස්වාමිවාක් ආරාධනය හා උත්තම පූජක යැදුම අතර පවතින සමාන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

- "පියාණනි" ලෙස (යනුවෙන්) දෙවිඳුන් ඇමතීම
- දේව ප්‍රශංසාව හා දේව නාමය අයැදීම
- දේව කැමැත්ත ඉටු කිරීම
- නපුරාගේ බලයෙන් මුදාගනු පිණිස යැදුම

(iii) ශුද්ධ වූ ජුවාම්තුමා දක්වන, උත්ථානයෙන් පසු ක්‍රිස්තුන් වහන්සේගේ දර්ශනය වීම් **හතරක්** සඳහන් කරන්න.

- මග්දලාවේ මරියාට දර්ශනය වීම
- ශ්‍රාවකයන්ට දර්ශනය වීම
- තෝමස්ට දර්ශනය වීම
- තිබේරියස් මුහුදේ ශ්‍රාවකයන්ට දර්ශනය වීම

(iv) කිතුනු ජනවන්දනාවට ග්‍රීක මූලාශ්‍රවලින් ලද ආභාෂ **හතරක්** ලියා දක්වන්න.

- ජන වන්දනාවේ භාවිත කරන බොහෝ වචන
- වැඩිහිටි ප්‍රසාද ස්නාපන පිළිවෙතට ආලේප කිරීම ද සම්බන්ධ කිරීම
- යකුන් දුරු කිරීම
- සර්ව රාත්‍රීක බෞතිස්මය
- ප්‍රාර්ථනා ශෛල යැදුම්

(v) රෝමානු කතෝලික ජනවන්දනා පිළිවෙත්වල විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

- ගාම්භීර බව
- සාමයෙන් යුක්ත වීම
- බුද්ධි ගෝචර වීම
- කෙටි වීම

**(ලකුණු 4 × 5 =20)**

04. අභිමතාර්ථය - ඉශ්රායෙල් කාන්තාර ගමන තුළ ලැබූ දිව්‍ය සංරක්ෂණය කිතුණු දිවිය තුල දී අත්දකියි.

(i) කාන්තාර ගමනේ දී ඉශ්රායෙල් ජනතාව දේව සංරක්ෂණය අත්දුටු අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- වළා ටැඹ හා ගිනි ටැඹ
  ඉශ්රායෙල් ජනයා සමග දෙවියන් වහන්සේ වැඩ සිටීමේ සළකුණක් ලෙස දිවා කාලයට වළා ටැඹක් ද, රාත්‍රී කාලයට ගිනි ටැඹක් ලෙස ද වැඩ සිටි සේක.

- මාරා නැමැති ස්ථානයේ පිපාස වීම
  දින තුනක් යන තුරු පිපාසව සිටි ජනයාට කරදිය ජලය මිරිදිය ජලය බවට පත්කර බීමට දුන් සේක.

- මස්සා හා මෙරිබා යන ස්ථානවලදී ජලය ලැබීම
  රෙපිඩිම් නම් ස්ථානයේ ජලය නොතිබුණු අතර මෝසෙස්තුමා දේව නියමය මත පර්වතයට තට්ටු කළ විට ජලය ලැබීම

- පාළුකරයේදී (සීන් කාන්තාරයේදී) ආහාර සැපයීම
  ආහාර හිඟවීම හේතුවෙන් ඉශ්රායෙල් ජනතාව මැසිවිලි නැගූ විට ඔවුනට ආහාර ලෙස මන්නා හා වටුවන් ලබා දුන් සේක.

- ලෝකඩ සර්පයා
  විසකුරු සර්පයන් දෂ්ඨ කිරීමෙන් ඉශ්රායෙල් සෙනඟ බොහෝ සෙයින් මරණයට පත් වන්නට වූ විට සමිඳාණන් වහන්සේ කී පරිදි මෝසෙස් තුමා ලෝකඩ සර්පයෙකු තනා රිටක ගසා පෙන් වූ අතර එදෙස බැලූ ඔවුන් සුවපත් විය.

- ආක්‍රමණ වලින් ආරක්ෂා වීම.
  ඉශ්රායෙල් ජනයා අමෙලෙක්වරුන්ගේ ආක්‍රමණයට ගොදුරු වූ අතර යාච්ඤා කිරීම හේතු කොට ගෙන අමෙලෙක්වරු පරාජය විය. ඉශ්රායෙල් වරුන්ට ජය අත් විය.

- රතු මුහුද තරණය කිරීම
  මිසර හමුදාව ලුහු බඳිමින් එන විට මුහුද දෙබෑ වී ඉශ්රායෙල් ජනතාවට එතෙර වීමට මඟ පාදා දුන් සේක.

**(මෙවැනි අවස්ථා 05ක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 2×5=10)**

(ii) කිතුනුවකු වූ ඔබ එදිනෙදා ජීවිතය තුළින් දිව්‍ය සංරක්ෂණය අත්දකින අවස්ථා **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- ජීවිත ගමනේ දී එදිනෙදා මුහුණ දීමට සිදුවන දුක් කරදරවලදී.
- අපට පැමිණෙන ජීවිත අභියෝග වලදී.
- හදිසියේ යම් යම් තීරණ ගැනීම් වලදී.
- ජීවන ගමනේ තනිවීම්, අසරණ වීම් වලදී.
- හදිසි වෙන් වීමකදී.

**(මෙවැනි කරුණු ලියා ඊට අදාලව පැහැදිලි කර ඇත්නම් කරුණු 05කට ලකුණු 2×5=10)**

05. අභිමතාර්ථය - සමදර්ශක සුභාරංචි අන්තර්ගතය පිළිබඳව සිසු ආකල්ප පරික්ෂා කිරීම.

(i) ශුද්ධ වූ මාක් සුභ ආරංචියේ කතෘත්වය, පරමාර්ථ හා මූලික ලක්ෂණ පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

**කර්තෘත්වය**

- මෙම කෘතිය මාක් තුමා විසින් ලියන ලද බව මුල් කාලයේ සභාවේ පිළිගැනීමයි.
- සභා පියවරුන් දක්වන පරිදි මාක් ශුභාරංචියේ කර්තෘ පේදුරු තුමාගේ සහයක හා භාෂා පරිවර්තක ලෙස ක්‍රියා කළ මාක් නැමැත්තෙක් ය.
- අපොස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි ජොහන් මාක් නැමති පුද්ගලයෙකු හා පේදුරු තුමාගේ සේවය අතර සම්බන්ධතාවයක් පෙන්වා දෙන බැවින් මෙම කෘතිය සඳහා පේදුරු තුමාගෙන් කරුණු ලබා ගෙන ඇත.
- මාක් ශුභාරංචියේ කර්තෘ මුල් කිතුණු සභාවේ ඇදහිලිවන්ත බැතිමතෙකු මෙන්ම දෙවන පරම්පරා සභා සාමාජිකයකු බව පිළිගැනේ.
- ක්‍රි. ව. 60-70 කාලයේ දී සුභාරංචිය ලියවී ඇත.

**පරමාර්ථ**

- ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් කුරුසිය තුළින් ගැලවීම අත්කර ගත හැකි බවත් පහදා දීමට
- නීරෝගේ පීඩන සමයේ රෝමයේ විසූ කිතුණු ජනතාවගේ ආධ්‍යාත්මික සැනසීම සඳහා ලියා ඇත.
- සැනසීමේ කාලය ඉතා ලඟ බව කිතුණුවන්ට දක්වීම සඳහා මෙම ශුභාරංචිය උත්සහ දරා ඇත.
- සැනසීමේ කාලය ලෙස හඳුන්වා දෙනුයේ ක්‍රිස්තුස් වහන්සේගේ මහිමාන්විත දෙවන පැමිණීම විය හැකි බව විශාරද මතයයි.
- මූලික ලක්ෂණ
- ජුදා චාරිත්‍ර විස්තර කර ඇත.

- ලතින් පාරිභාෂික ශබ්ද යොදා ඇත.
- රෝම ක්‍රමයට කාල සීමා දක්වා ඇත.
- අරමීය වචන හා වාක්‍යාංශ පරිවර්තනය කර ඇත.
- ඉතා කෙටි, සරල, අත්විතීය රචනා ශෛලයක් භාවිත කර ඇත.
- අරමීය භාෂාවේ වදන් භාවිත කිරීමෙන් ක්‍රිස්තුස් වහන්සේ ඉතා සමීපව සහ උන්වහන්සේ භාවිත කළ බස ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත.
- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට වඩා උන්වහන්සේගේ ක්‍රියාවලට මුල් තැනක් දී ඇත.
- මුළු සුවිශේෂය පුරාම උද්‍යෝගිමත් හා ක්‍රියාශීලී ස්වභාවයක් දක්නට තිබේ. (එකෙනෙහිම, ඒ ඇසිල්ලෙහිම යන වචනය හතළිස් වතාවක් සඳහන් කර තිබීම)
- ජේසුස් වහන්සේගේ දූත සේවාව ගලීලයේ සිට ජෙරුසලම දක්වා ඉදිරිපත් කරයි.
- මෙසියානික රහස ඉදිරිපත් කර ඇත.
- ජේසුස් වහන්සේගේ මනුෂ්‍යත්වය සහ දේව රාජ්‍ය පිළිබඳව කථා කරයි.
- යුගාන්ත ධර්මය ගැන කථා කරයි.
- ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ අවසාන කාලයේ සිදුවීම් සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.
- දුක්ප්‍රාප්ති සිදුවීම්, මරණය හා උත්ථානය ආදියට වැදගත් ස්ථානයක් හිමිවී ඇති නිසා මෙය දුක්ප්‍රාප්තියේ සුභාරංචිය ලෙස ද හඳුන්වයි.
- ජේසුස් වහන්සේ බලධාරී කෙනෙකු ලෙස ඉදිරිපත් කර ඇත.

**(මේ ආකාරයට කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 10 යි)**

(ii) දේව රාජ්‍යයේ වටිනාකම් විදහා දක්වන උපමා **පහක්** නම් කොට එයින් ලබන්නා වූ පණිවිඩ **පහක්** ඔබගේ ජීවිතයට සම්බන්ධ කරගනිමින් කෙටියෙන් විස්තර කරන්න.

- නිධානය පිළිබඳ උපමාව -

  **වටිනා යමක් ලබා ගැනීමට** තමන් සතු සියල්ල විකුණිය **යුතු** බව

- මුතු ඇටය පිළිබඳ උපමාව -

  දේව රාජ්‍ය නැමති ජීවිත ක්‍රමය සමාජ මට්ටමින් දුෂ්කර, එතරම් සිත් පිනවන බැවින් යුතු නොවුනත් එය සදාතනික සතුට උරුම කර ගනියි.

- දැල පිළිබඳ උපමාව -

  දේව රාජ්‍ය උරුම කර ගැනීමට සියලුම දෙනාට හිමිකම තිබුණත් කැඳවනු ලැබූ සියලුදෙනා ම දේව රාජ්‍යයට ඇතුල් නොවන බව.

- මහා මංගල භෝජනය පිළිබඳ උපමාව -

  විවාහ මංගල්‍යයට සියලු දෙනාට ආරාධනා කළත් ඔවුන් සමහරක් නුසුදුසු ඇඳුමින් මංගල භෝජනයට සහභාගි වෙයි.

  **දෙවිඳුන් දෙන ආරාධනය පිළිගැනීමට සුදානම්ව සිටිය යුතු බව**

- අබ ඇටය පිළිබඳ උපමාව -

  ලෝකයට ඵලදායී දෙයකි. එහි සෙවණ සියල්ලන්ට ලැබෙන බව.

  **ප්‍රමාණයෙන් කුඩා වුවත් වර්ධනයෙහි විශාල බව**

**(ඉහත උපමා සහ විවරණයන් තම ජීවිතවලට සම්බන්ධ කරමින් ලියා ඇත්නම් ලකුණු 10 යි. උපමා පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු 5යි.)**

06. අභිමතාර්ථය - දේව අභිමතයට විරුද්ධව කටයුතු කිරීම නිසා ඉශ්රායෙල් ජනතාවට අත්විදීමට සිදු වූ විපාක පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම.

(i) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයට පෙර පලස්තීනය යටත් කරගෙන සිටි අධිරාජ්‍යයන් **තිදෙනකු** නම් කොට එම කාලවල සිදු වූ විශේෂ සිදුවීම් **දෙකක්** විස්තර කරන්න.

- පර්සියානු අධිරාජ්‍යය - සයිරස් රජු
- ග්‍රීක අධිරාජ්‍යය - මහා ඇලෙක්සැන්ඩර්, අන්තියෝකස් එපිපානිස්
- රෝම අධිරාජ්‍යය - ජුලියස් සීසර්, මහා හෙරෝද්, හෙරෝද් ඇන්ටිපස් පොම්පේ, පොන්සියුස් පිලාත්

**(අධිරාජ්‍ය 3ක් හෝ අධිරාජ්‍යවල සිටි අධිරාජ්‍යවරු 3ක් නිවැරදිව නම් කොට ඇත්නම් ලකුණු 2×3=6)**

- පර්සියානු අධිරාජ්‍යය
- බැබිලෝනිය යටත් වීම නිසා ජුදෙව්වන්ට නැවත සිය රටට ආපසු පැමිණීමට හැකිවීම.
- ජෙරුසලෙම් පවුර ඉදි කිරීම.
- නීතිගරුක ජනතාවක් බවට පත් වීම (එස්රා මඟින්).

- ග්‍රීක අධිරාජ්‍යය
- මහා ඇලැක්සැන්ඩර් අධිරාජයා යටතේ මිසරයේ සිට භාරතය දක්වා මුළු මැද පෙරදිග සිය අණසක පැතිර වීම.
- අධිරාජ්‍යයේ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ආභාෂයන් කෙරෙහි බලපෑම
- පුරාණ ගිවිසුම ග්‍රීක භාෂාවට පරිවර්තනය කිරීම. එය සෙප්ටුවාජින්ත ලෙස හැඳින්වීම.
- නව ගිවිසුම ග්‍රීක භාෂාවෙන් ලිවීම.

- රෝම අධිරාජය
- හෙරෝද් රජු , ප්‍රාදේශීය රජෙකු ලෙස පත් කිරීම.
- ක්‍රිස්තුන් වහන්සේගේ උපත මහා හෙරෝද්ගේ කාලයේ සිදු වීම.

**(ඒ ඒ අධිරාජ්‍ය සමය තුළ සිදුවූ වැදගත් සිදුවීම් 02කට ලකුණු 2×2= 4)**

(ii) ශුද්ධ වූ පාවුලුතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් **පහක්** නම් කර ඒවා වර්තමාන සමාජයට උචිත වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**නායකත්වය හා බැහැපත්කම (එපීස 1:3 - කොලො 1:15-20)**

- දෙවියන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ මගින් මුළුමනින් ම එළිදරව් වේ. උන්වහන්සේ දෙවියන් වහන්සේ ය.
- ක්‍රිස්තුන් වහන්සේ මුළු මැවිල්ලේ අගතැන් ගන්නා සේක. මේ මගින් උතුම්බව සහ තේජාන්විත බව අරුත් ගැන්වෙයි.
- ක්‍රිස්තුන් වහන්සේ සභාව නැමති ශරීරයේ හිස ය. ක්‍රිස්තුන් වහන්සේ මගින් සභාව උපත ලැබුවේ ය.
- පාපයේ විපාකය මගින් දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර පවතින යහපත් සබඳතා බිඳ වැටී දෙවියන් වහන්සේගෙන් ඈත්ව ජීවත් විය. නමුත් දෙවියන් වහන්සේ නොකඩවා මිනිසාට ප්‍රේම කළ නිසා සමගි කිරීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට එවූ සේක.
- ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ මරණය මගින් සියලු මැවිල්ල දෙවියන් වන්සේ සමග ඒකාබද්ධ විය. ක්‍රිස්තුන් වහන්සේ සැම මැවිල්ලකට ම වඩා උතුම් වූ තැනන් වහන්සේ ය. ඉතා උසස් තැනන් වහන්සේ ය.
- ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමීත්වය අප සැම පිළිගත යුතු ය.
- අපගේ ජීවිතයේ, අපගේ පවුල්වල උන්වහන්සේ රජාණන් විය යුතු ය.
- අද සමාජය තුළ නායකයා අනෙක් අයට ආදර්ශමත් විය යුතු ය. එහි දී වචනයෙන් නොව ක්‍රියාවෙන් ආදර්ශමත් විය යුතු ය.
- අනෙකා පිළිගන්නාවූත්, අනෙකාට සවන් දෙන්නාවූත්, බැගෑපත් ලෙස කටයුතු කරන්නෙක් නායකයා විය යුතු ය.

**බැගෑපත්කම (පිලිප්පි 2:5-11)**

- "ජීවත්වන්නේ මා නොව, මා තුළ ක්‍රිස්තුන් වහන්සේ ජීවත් වන සේක. මගේ ජීවිතය ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයට හරවන්නට නම් මගේ සිත ක්‍රිස්තුන් වහන්සේගේ සිත මෙන් වෙනස් විය යුතු ය....." (පිලිප්පි 2:5) ලෙස විස්තර කරන පාවුලුතුමා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය මගින්, ක්‍රියාව මගින්, එළිදරව් වූ උන්වහන්සේගේ හදවතේ ස්වභාවය අපට පෙන්නුම් කර එම ස්වභාවය ම අප හදවත් තුළ ඇතිකර ගත යුතු යැයි කියා , විශේෂයෙන් උන්වහන්සේගේ බැගෑපත්කමේ උතුම්කම අපට විස්තර කරන්නේ ය.

- දෙවියන් වහන්සේගේ ස්වරූපය දරූ උන්වහන්සේ එය ඉවතලා අප හා සමාන මනුෂ්‍යයෙකු වූ සේක.
- ජේසුස් වහන්සේ වෙනස් නොවන දේවත්වය දරූ තැනන් වහන්සේ ය. උන්වහන්සේ දෙවියන් වහන්සේ ය. නමුත් උන්වහන්සේ දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙනම තබාගත යුතු වස්තුවකැයි නොසිතූ සේක.
- සියලු දේ ඉවතලා සේවකයෙකුගේ ස්වරූපය ගෙන අප හා සමාන මනුෂ්‍යයෙකු වූ සේක. "හිස්කර ගැනීම" සඳහා පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය, කිසිවක් නොතබා සම්පූර්ණ හිස් වීම ය.
- ජේසුස් වහන්සේ මනුෂ්‍යත්වය ගැනීම සඳහා තමන් වහන්සේගේ දේවත්වයෙන් සිය කැමැත්තෙන් හිස් වූ සේක. තමන් වහන්සේගේ අයිතීන්, දේව ස්වභාවය, තේජශ්‍රීය යනාදී සැම දෙයක්ම ඉවත දැමූ සේක.
- ජේසුස් වහන්සේ පාපය හැර අනිත් සියලු දෙයින් මිනිසාට සමාන වූ සේක.
- මිනිසෙකු වූවා පමණක් නොව උන්වහන්සේ වහලෙකු ද වූ සේක. වහලෙකු වූවා පමණක් නොව, ඉතා පහත් මට්ටමේ වහලෙකු වූ සේක. වහලකුට තමාගේ අයිතිවාසිකම් සියල්ලම නැති වන්නා සේ මිනිසෙකුට ලැබෙන ඉතා නීච දඬුවම් ක්‍රමය කුරුසියේ මරණය යි.
- උන්වහන්සේ මිනිසා මත බලය පෑමට නොව, ඔවුන්ට සේවය කිරීමට කැමති වූ සේක. උන්වහන්සේ තමන්ගේ කැමැත්ත අනුව ජීවත් වූ කෙනෙකු නොව පියාණන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් වීමට අභිප්‍රාය කළ සේක. උන්වහන්සේ තමන් වහන්සේ උසස් කර ගත්තේ නැත. ජනතාව වෙනුවෙන් තමන් පහත් කරගෙන තමාට හිමි මහිමය අත්හැර දැමුවේ ය.
- ක්‍රිස්තුන් වහන්සේගේ ත්‍යාගශීලීභාවය, උන්වහන්සේගේ හිස්වීම, බැගෑපත්කම, කිසිදු මිනිසෙකුට නොලැබුණු තේජමාන තත්ත්වය උන්වහන්සේට ලබාදුනි.
- දෙවියන් වහන්සේ ක්‍රිස්තුන් **වහන්**සේව මහිමයට පත්කර, උන්වහන්සේට සියලු නාමවලට වඩා අග්‍ර නාමය දානය කළ සේක.
- අද සමාජය තුළ අපගේ සේවය ද අව්‍යාජව සිදු කළ යුතුය. පූර්ණ කැපවීම අත්‍යවශ්‍ය වේ.

**පවුල් දිවිය (1 කොරි 6:1-6, එපීස 5:22-30)**

- කිතුනු පවුල ශු: සභාවේ ජීවනාලිය වේ. කිතුනු පවුල් රාශියකින් ගොඩනැගුණු දෙවියන් වහන්සේගේ විශේෂ පවුල ශු.සභාවයි. කිතුනු පවුල ගෘහස්ථ සභාවකි. එම නිසා පවුල් ජීවිතය හා ශු. සභාවේ ජීවිතය අතර කිට්ටු සම්බන්ධතාවක් ඇත.
- ස්වාමි පුරුෂයා, තම භාර්යාව තමාගේ අවශ්‍යතා ඉටුකර ගැනීමේ උපකරණයක් ලෙස හෝ භාර්යාව තම ස්වාමි පුරුෂයා තමාගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමේ උපකරණයක් ලෙස භාවිත නොකළ යුතු ය. ස්වාමි පුරුෂයාගේ ශරීරය භාර්යාවට හිමිවෙයි. භාර්යාවගේ ශරීරය ස්වාමි පුරුෂයාට හිමිය.

- විවාහ සම්බන්ධතාවයේ දෙදෙනා අතර ගරු කිරීමක් තිබිය යුතු ය. දෙදෙනා ශාරීරික වශයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද, දෙපක්ෂය අතර, එකිනෙකා වෙනුවෙන් අනිත් කෙනා තමාව කැපකළ යුතු ය.

**උත්ථානය හා දෙවන පැමිණීම ( 1 තෙස 4 :14 , 1 කොරි 15 : 12 )**

- මළාවූ අය නැවත නැගිටීම සම්බන්ධයෙන් තෙසලෝනිකවරුන් හා කොරොන්තිවරුන් තුළ පැන නැගී තිබුණු ප්‍රශ්නයට පාවුලු තුමා පිළිතුරු දේ.
- ක්‍රිස්තුන් වහන්සේ නැවත නැගිට වදාළ බැවින් මළවුන්ගෙන් නැවත නැගිටීම ප්‍රතික්ෂේප කළ නොහැක.
- මහිමාන්විතව නැවත පැමිණෙන ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ අය (මළාවූ අය) ප්‍රථමයෙන් උත්ථාන කරනු ලබන බව.
- ක්‍රිස්තියානින් දිනපතා පාපයට මැරී ක්‍රිස්තුන් වහන්සේගේ නව ජීවිතයට සාක්ෂි දරයි.

**මාංශ උත්ථානය (1 කොරි 15 : 35-38)**

- මළවුන්ගේ මාංශ උත්ථානය තහවුරු කරයි. මළාවූ අය වළලනු ලැබූ එම සිරුරෙන් ම අන්‍යරූප වූ ශරීරයකින් උත්ථාන වෙති.
- දිරාපත් නොවන ආත්මය ගැන කථා කරයි.
- වළලනු ලබන්නේ ස්වභාවික ශරීරයයි.

- උත්ථාන කරනු ලබන්නේ අධ්‍යාත්මික ශරීරයයි.
- මේ බව පැහැදිලි කිරීමට වළලනු ලැබූ බීජයක් උපමා කර ගනිමින් කතා කරයි.

**සහෝදරත්වය හා එකමුතුකම (1 කොරි 8:9-13, 13:3-8, 2 කොරි 8:9)**

- ශුද්ධාත්මයාණන්ගේ වරමින්, ක්‍රිස්තුන් වහන්සේ තුළ විශ්වාසය තබා ජීවත් වන අය ක්‍රිස්තුන් වහන්සේ සමඟ එකිනෙකා සමඟ එකමුතුව සිටිති. ප්‍රසාද ස්නාපනය මගින් ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාවේ සහභාගී වී උන්වහන්සේ සමඟ උන්වහන්සේ තුළ ජීවත් වෙති.
- ශු. සභාවේ සාමාජිකයින් අතර පවතින එකමුතුකම, මිනිස් සිරුරක අවයවයන් අතර පවතින එකමුතුකම හා සමාන කොට අත් දකියි.

**ශුද්ධාත්මයාණන්ගේ දීමනා හා ඵල (1 කොරි 12,14:1-8)**

- දෙවියන් වහන්සේ අපට දානය කරන දීමනා අතරින් උසස්ම දීමනාව උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය. එම ශුද්ධාත්මයාණන් වහන්සේ අප හදවත්හි ලැගුම් ගන්නා සේක. උන්වහන්සේ නොමිලේ දානය කරන දීමනා මගින්**,** උන්වහන්සේව අපට එළිදරව් කරන සේක.
- ශුද්ධාත්ම දීමනා 7ක් ද, ශුද්ධාත්ම ඵල 12ක් ද ඇත.

**(මෙවැනි ඉගැන්වීම් පහක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 2×5=10)**

07. **අභිමතාර්ථය :- ශුද්ධ වූ සභාව කාලානුරූපී කර ගැනීමට නිසි මග ගැන්වීම සඳහා සභාව දැක්වූ දායකත්වය පිළිබඳ සිසු අවබෝධය පරීක්‍ෂා කිරිම**

(i) දහසය වන සියවසේ ශුද්ධ වූ සභාවේ ප්‍රතිසංස්කරණ කාර්යය ඉදිරියට ම ගෙන යාමට නායකත්වය ගත් පූජක, පැවිදි නිකාය **පහක්** නම් කර ඒවා පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

- කාර්මෙල් නිකාය
- කැපුචින් නිකාය
- ශුද්ධ වූ වින්සෙන්ති ද පාවුලා නිකාය
- ජේසු නිකාය
- දයාවේ සෙහොයුරියන්ගේ නිකාය
- ද ලාසාල් නිකාය

**(නිකායන් 5 ක් නම් කිරීමට ලකුණු 1x5=5)**

**කාර්මෙල් නිකාය**

- පලස්තීනයේ කාර්මෙල් කන්දෙහි 12 වන සියවසෙහි ආරම්භ වී ඇත.
- මෙම නිකායට අයත් තාපසයන් කාර්මෙල් කන්දෙහි හුදකලාව ජීවත් වූ අතර දැඩි තාපස ජීවිතයක් ගත කළහ
- ශු. සයිමන් ස්ටොක් මෙම පැවිදි ජීවිත ක්‍රමය එංගලන්තයට හඳුන්වා දුන්නේ ය.
- විශ්ව විද්‍යාලය ආශ්‍රිත නගරවල කාර්මෙල් නිකායේ තාපසාරාම බිහි කිරීමට කටයුතු කළේ, තාපසවරුන් විශ්ව විද්‍යාලවල දේශනා කරමින් ධර්මදූත සේවයේ යෙදුණු බැවිනි.
- කාර්මෙල් නිකායේ පැවිදිවරියක වූ අවිලාහි තෙරේසා තුමිය (1515-1582) තම පැවිදි නිකාය තුළ නවෝදයක් ඇති කිරීමට උත්සාහ කළා ය.
- කාර්මෙල් නිකායේ පැවති තාපස දිවියේ, භාවනානුයෝගී ජීවිතය නැවත ඇති කරලීමට අවිලාහි තෙරේසා තුමියගේ උත්සාහය නිසා හැකි විය. ඇයට කුරුසියේ ජුවාම්තුමාගේ සහයෝගය ලැබිණි.
- " පූර්ණ දිවියකට මග" (The Way of Perfection) "ඇතුළාන්ත මන්දිරය" (The Interior Castle) අවිලාහි තෙරේසා තුමිය විසින් රචිත විශිෂ්ඨ අධ්‍යාත්මික කෘති ය.
- අවිලාහි තෙරේසා තුමියගේ යොමු කිරිම සහ මගපෙන්වීම මගින් කුරුසියේ ජුවාම් තුමා (1542-1591) පුනරුදයට දායක විය. මෙතුමා විසින් අධ්‍යාත්මික ජීවිතය පිළිබඳ පහත ග්‍රන්ථ ලියනු ලැබ ඇත.

**කාර්මෙල් පර්වතය නැගීම** - The Ascent of Mount Carmel
**ආත්මයේ අඳුරු රාත්‍රිය** - Dark Night of the Soul
**ආධ්‍යාත්මික ගීතය** - The Spiritual Canticle
**ප්‍රේමයේ ජීවන දැල්ල** - The Living Flam of love

**කැපුචින් නිකාය**

- 16 වන සියවසේ ඉතාලියේ බිහි වු පැවිදි නිකායන් අතරින් කැපුචින් නිකාය ප්‍රධාන වේ. මෙය 13 වන සියවසේ ආරම්භ වූ ප්‍රැන්සිස්කාන නිකායෙන් බිහි වූවකි.
- අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් තුමා නීතිය ඉතා සූක්‍ෂම ලෙස පිළිපැදිය යුතු යැයි කළ ප්‍රකාශය හා ශුද්ධ ලියවිලි අනුව ජීවිත ක්‍රමය නැවත ඇති කරලීමේ අදහසින් කැපුචින් නිකාය බිහි කරන ලදි.
- මොවුනට නායකත්වය ලබාදෙමින් ප්‍රැන්සිස්කාන නිකායේ මතේඕ ද බස්සිකෝර්ගේ දායකත්වය තුළ බිහිවූවකි.
- නිකාය ආරම්භයේ දී ඉමහත් බාධක ශු. සභාවෙන් ම මතු වුව ද මෙම නවෝදය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදිණි. මොවුහු තම ධර්මෝපදේශ සේවයත්, ආශ්‍රමික ජීවිතයත් එකට එක් කර දිවි ගෙවූහ. ලෙඩුන්ට උපස්ථාන කරමින් හා ඉතා දුෂ්කර ලෙස වැඩ කිරීමෙන් ලබා ගත් ආදායමෙන් ජීවත් වූහ. ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවාදීන්ට විරුද්ධ ව දේශනා කළහ. දිළිදු ජීවිතයක් ගත කළහ.

**ශුද්ධ වූ වින්සෙන්ති ද පාවුලා නිකාය**

- ශුද්ධ වු වින්සෙන්ති ද පාවුලු තුමා සභා ප්‍රතිසංස්කරණය සදහා පූරෝගාමී ව කටයුතු කළ කෙනෙකි.
- මෙතුමා දිළිදුන් කෙරෙහි ගැඹුරු ආදරයක් හා කරුණාවක් දක්වූ කෙනෙකි.
- ක්‍රි.ව. 1625 වින්සන්ති ද පාවුලු තුමා විසින් වින්සෙන්තියානු නිකාය ප්‍රංශයේ ආරම්භ කෙළේ ය. මෙහි අරමුණු වූයේ පූජක පුහුණුව සහ දූගීන්ට ධර්ම දානය ලබා දීමය
- කතෝලික ධර්මය දේහනා කර ප්‍රතිසංස්කරණවාදී ඉගැන්වීම්වලට ප්‍රතිචාර දක්වීම මොවුන්ගේ සේවාව විය.
- ශු. සභාව තුළ ප්‍රතිසංස්කරණ ඇති කරලිමට ක්‍රම දෙකක් වින්සේන්තියානු නිකායය විසින් අනුගමනය කරන ලදි.
    1. පැවැදි නිකායයන් සංවිධානය කර ආදර්ශවත් පූජකවරුන් බිහි කිරිම.
    2. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් අනුව පූජකවරුන් බිහි කිරිමේ වගකීම පැවැදි නිකායයන්ට ලබා දීම
- ශුද්ධ වු වින්සෙන්ති පාවුලා තුමා විසින් 1633 වින්සන්ට් ද පාවලා මුනිතුමාගේ දයාවේ සොහොයුරියන්ගේ නිකායද (Sister of charity St. Vincent de Paul) ආරම්භ කරන ලදි.

**ජේසු නිකාය**

- සභා ප්‍රතිසංස්කරණවාදී පසුබිමක බිහි විය.
- ලොයලාහි ශුද්ධ වූ ඉග්නාසියුස් තුමන් විසින් ක්‍රි.ව. 1533 ආරම්භ කරන ලදි.
- එතුමා යුද වැදී තුවාල ලැබ ප්‍රතිකාර ලබමින් සිටි කාලය තුළ කියවීමට ලද ශුද්ධ ලියවිල්ල හා ශුද්ධවන්තයන්ගේ ජීවිත කථා තම ජීවිත පරිවර්තනයට හේතු විය.
- නුගත් ජනතාවට දිළිඳුනට අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් බිහිවූ මෙම නිකාය පසුව රාජ කුමාරවරුන්ට හා රජවරුන්ට ද අධ්‍යාපනය ලබා දිමට යොමු විය.
- වේදහාර රකිමින් කැප වූ ජීවිතයක් ගත කිරීමක් ශුද්ධෝත්තම පියතුමාගේ නියෝගවලට කීකරු වීමට පොරොන්දු වීමත් මෙම නිකායයේ විශේෂ ලක්‍ෂණයකි.
- කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා ආරක්‍ෂා කර ගැනීම ජේසු නිකායික ධර්මදූතවරුන්ගේ කාර්යය විය.
- ප්‍රතිසංස්කරණ සභා බිහිවූ යුගයේ කතෝලික සභාවේ නවෝදය ජේසු නිකායික පූජා ප්‍රසාදින් වහන්සේලා විසින් ඉදිරියට ගෙන යන ලදි.
- අධ්‍යාත්මිකත්වයෙන් හා දේව ධාර්මිකත්වයෙන් පූර්ණ වූ මොවුන් අතරින් ශුද්ධ වූ ඉග්නාසියුස් තුමා විසින් රචිත " අධ්‍යාත්මික පුහුණුව " (Spiritual Exercise) ග්‍රන්ථය ද ශුද්ධ වූ පීටර් කැනිෂියස් තුමන් විසින් රචිත ධර්මෝපදේශ ග්‍රන්ථ තුනද කතෝලික ධර්ම උපදේශයේ වර්ධනයට ඉවහල් වූ අතර ප්‍රතිසංස්කරණ වාදී සභාව තුල පවා ප්‍රශංසාවට ලක් වූ මෙය ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉමහත් පිළිගැනීමට ලක් විය.
- ජේසු නිකායික පියතුමෙකු වන ශුද්ධ වූ රොබට් බෙලාමියන් වැනි අය ත්‍රිදෙන්තිනූ මන්ත්‍රණ සභාවේ දේව ධර්මාචාර්ය වරයකු ලෙස කටයුතු කලේය.

**ශුද්ධ වූ වින්සන්ට් ද පාවුලු තුමාගේ දයාවේ සොහොයුරියන්ගේ නිකාය**

- ශුද්ධ වූ වින්සන්ට් ද පාවුලාතුමා විසින් ක්‍රි.ව. 1633 දී වින්සන්ට් ද පාවුලු මුනිතුමාගේ දයාවේ සොහොයුරින්ගේ නිකාය. (Sister of charity St. Vincent De Paul) ආරම්භ කරන ලදි.

**ද ලාසාල් නිකාය**

- ශාන්ත ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් මුනිතුමා මෙම නිකායේ නිර්මාතෘ වරයාය.
- ප්‍රංශයේ රෙයිම්ස් නගරවේ පිහිටි ආසන දෙව්මැදුරේ මිසම් සේවක පියතුමා වශයෙන් කටයුතු කරන සමයේ දී එතුමා ප්‍රංශයේ දිළිඳු පිරිමි ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් ක්‍රි.ව. 1680 දි පූජක නොවන අයගෙන් සමන්විත දලාසාල් නිකාය ආරම්භ කළේය.
- දිළිඳු දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දීම, නව ඉගැන්වීම් ක්‍රම හඳුන්වාදීම අරමුණ විය.
- කිතුනු ගුරුවරුන්ගේ නාම සාන්තුවරයා වන්නේ ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් මුනිතුමාය.

**(නිකායන් 05 ක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 1×5=5)**

(ii) ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරුදීම සඳහා ආරම්භ කරන ලද ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (1545-1563) විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘති **පහක්** සඳහන් කර, ඒවා ඔබගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

**ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘති**

- පූර්ණඵල පිළිබඳ දේශණා කිරිම අත්හිටුවීම
- මරියතුමියට හා ශුද්ධවන්තයන්ට නියමිත පරිදි ගෞරව දක්වීමට උනන්දු කරවීම
- පූජක පුහුණුව සඳහා සෑම පදවියකට දෙව්සත්හලක් ආරම්භ කිරීම
- දිව්‍ය සත්ප්‍රසාදය ලබාගැනීමට උනන්දු කිරීම
- නිතර නිතර සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට උනන්දු කර වීම
- දිව්‍ය සත්ප්‍රසාදය වන්දනාව හා දිව්‍ය සත්ප්‍රසාද ආශීර්වාදය ලබා ගැනීමට උනන්දු කර වීම්

**(මෙවැනි ව්‍යාපෘති 05 නම් කිරීමට ලකුණු 05)**

**නවෝදයේ ව්‍යපෘති ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය**

- තමන් කරනු ලබන පව්වලට අවංකව මනස්ථාපනය වී යහපත් සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයට (පාපොච්චාරණයක්) ඇතුළු වීමෙන් පව් සමාව ලබාගත හැකිය.
- තුන්දෙනා වහන්සේලා (පීතෘ වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ) හා සාන්තුවරයන් අතර ඇති වෙනස අවබෝධ කර ගැනීමටත් ඒ තුළින් දෙවියන් වහන්සේටත් මරිය තුමියටත් ශුද්ධවන්තයන්ටද නියමිත පරිදි ගෞරව දක්වීමට උනන්දුවක් මේ තුළින් ඇති වීම.
- දෙව්සත්හල්වල පැවැත්වෙන දේව කැඳවීමේ කඳවුරුවලට සහභාගිවීමට අවස්ථාව ලැබීමෙන් තමන්ටත් ඒ සඳහා කැඳවීමක් ඇත්දැයි සිතා බලා තීරණ ගැනීමට අවස්ථාව ලැබීම.
- බිඳ වැටුණු දේව සබඳතාව යලි ගොඩනගා ගැනීමට නිතර නිතර සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගත යුතුය.මේ සඳහා මඟ පෙන්වීමටත් මෙ තුළින් ලැබේ.
- දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමානව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටියි.මේ නිසා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගැනීමට නිසි ශාරීරික හා ආධ්‍යාත්මික සූදානමක් තිබීම.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ ගෞරවාන්විතව හැසිරීමට හා නිසි වන්දනාව ලබා දීමට අප යොමුවිය යුතුය.
- ස්වාමින් වහන්සේ මෙන් අප ජීවිත කැඩී බිඳීම හෙවත් පරිත්‍යාගය හා කැපවීම අවශ්‍ය වේ.මේ සඳහා දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගැනීමට උනන්දු කරවීම අධ්‍යාත්මික ජීවිතය වර්ධනයට රුකුලක් වේ.

**(මෙවැනි කරුණු ඔස්සේ ඉහතින් සඳහන් කරන ලද නවෝදයේ ව්‍යාපාති ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 5යි.)**

08. අභිමතාර්ථය - ජුසේවාස් මුනිදුන් ශ්‍රී ලංකාවේ කතෝලික ජන ජීවිතයට ලබා දුන් පරිත්‍යාගය හා කැපවීම පිළිබඳ අවබෝධය ලබා දීම.

(i) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමන්ගේ ධර්මදූත ප්‍රතිපත්ති **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- දේශපාලන සම්බන්ධයෙන් හෝ රාජ්‍ය අනුග්‍රහයෙන් තොරව දේව සේවයට කැපවීම.
- දේව කැමැත්තට හිස නැමීම.
- ශ්‍රී ලංකාවේ ධර්ම සේවය අභියෝගය හමුවේ කිරීමට හැකිවීම.
- සමාජය තුල තිබූ පටු ආකල්පය හා ආගමිකයන්ට දැක් වූ ප්‍රතිපත්ති වල වෙනසක් ඇති කිරීම.
- තම ජීවිතයේ පැවැත්ම තුළින් සාක්ෂි දැරීම.
- දේශීය සංස්කෘතියේ ලක්ෂණ හදුනාගෙන ශ්‍රී ලංකාවේ භාෂාවට අවශ්‍ය පරිදි ආගමික පත පොත සකස් කිරීම.
- ධර්මදූත කාර්යයන් සඳහා ගිහි නායකත්වය යොදාගැනීම.
- යාච්ඤාවේ ජීවිතය තම ජීවිතයට ආභරණයක් කොටගෙන සියල්ල දෙවියන් වහන්සේ තුළ සිදු කිරීම.
- සිංහල හා දෙමළ යන භාෂා දෙකම ඉගෙන ගැනීමට ධර්මදූතවරුන් යොමුකිරීම.

උදා: ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා

**(මෙවැනි කරුණු 5කට ලකුණු 2×5=10)**

(ii) විවිධ ජාතීන්ගේ, ආගමිකයින්ගේ හා සමාජ කණ්ඩායම්වල අයිතිවාසිකම් වෙනුවෙන් මෑත යුගයේ මෙරට තුළ කිතුනු හඬ නැගීම පිළිබඳව කරුණු **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- ශ්‍රී ලාංකික ජාතීන්, ආගම්, සංස්කෘතිය තුල මාංශගත වීම.
- වසර ගනනාවක් සිට ශ්‍රී ලංකාවේ පැවත එන සංස්කෘතික දායාදයන්, සිරිත් විරිත්, සෞන්දර්ය ගැන මනා අවබෝධයක් ලබා ගැනීම, රිසි ලෙස කටයුතු කිරීම.
- සමාජය තුල නැගිගෙන දේශපාලන, ආර්ථික ක්‍රියාකාරකම්වලදී සාධාරණත්වයට ගරු කිරීම.
- සේවක අයිතිවාසිකම් පිළිබද තම ජීවිතයෙන් සමාජයට ආදර්ශමත් වීම.

**(මෙවැනි කරුණු ගොනුකර ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 2×5=10)**